**ඉදිකිරීම් අභ්‍යාස හා සංවර්ධන ආයතනය (ICTAD) - 2014**

---

ඉදිකිරීම් අභ්‍යාස හා සංවර්ධන ආයතනයේ (ICTAD) 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය හා 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනතේ 29 (2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 විගණන මතය**

මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට ඉදිකිරීම් අභ්‍යාස හා සංවර්ධන ආයතනයේ (ICTAD) මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති (ශ්‍රී ලං රා ගි ප්‍ර)**

ශ්‍රී ලං රා ගි ප්‍ර 7 - දේපල, පිරියත හා උපකරණ - ප්‍රමිතියේ 49 ඡේදය ප්‍රකාරව, දේපල , පිරියත හා උපකරණ අයිතමයන් ප්‍රත්‍යාගණනය කරන්නේ නම්, එම වත්කම් අයත් පන්තියේ සියලු දේපල, පිරියත හා උපකරණද ප්‍රත්‍යාගණනය කළ යුතුය. කෙසේ වුවද මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.685,343,662 ක් වටිනා දේපල, පිරියත හා උපකරණ තුළ ඇතුළත් පොත් වටිනාකම රු.111,825,105 ක් වූ ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය කර නොතිබුණි. තවද දේපල, පිරියත හා උපකරණවල ධාරණ අගය නිශ්චය කර ගැනීම සඳහා පිරිවැය ක්‍රමය හා ප්‍රත්‍යාගණන ක්‍රමය යන ක්‍රම දෙකම යොදාගෙන තිබුණි.

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 දෙසැම්බර් 31 දිනට සත්‍යාපනය කරන ලද තොග ශේෂය වෙනුවට එදිනට ලෙජරයේ තොග ශේෂය මූල්‍ය ප්‍රකාශනවලට ගෙන තිබුණි. එබැවින් මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.138,714,770 ක් වූ අවසාන තොගයේ නිරවද්‍යතාවය සහ එයින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම තහවුරු කර ගත නොහැකි විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ වාර්ෂික තොග සත්‍යාපන වාර්තා අනුව, තොග අයිතමයන් 47 ක් අතිරික්ත ලෙස හඳුනාගෙන තිබුණි. කෙසේ වුවද මේ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදනයක් කර නොතිබුණි.

(ඇ) ආයතනයට " Gesellschaft fur Internationale Zusammenabeit (GIZ) " ව්‍යාපෘතියෙන් 2013 වර්ෂයේදී ලැබී තිබුණු රු.14,286,462 ක් වූ වත්කම්වලින් රු. 1,410,778 ක් වටිනා වත්කම් ප්‍රාග්ධනීත කිරීමෙන් තොරව 2014 දෙසැම්බර් 31 වන විටත් තොගයේ පැවතුණි.

**2.2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ .

(අ) ඉදිරිපත් කරන ලද කාල විශ්ලේෂණයට අනුව, 2014 දෙසැම්බර් 31 දිනට රු.2,550,614 ක් වූ විවිධ ණය හිමියන් වර්ෂ 3 කට වැඩි කාලයක් හිඟ හිට පැවතුණි. ඒ අතරින් රු.1,719,187 ක මුදලක් වර්ෂ 5 කට වැඩි කාලයක් නිරවුල් කිරීමෙන් තොරව පැවතුණි.

(ආ) 2014 දෙසැම්බර් 31 දිනට ඉදිකිරීම් උපකරණ පුහුණු මධ්‍යස්ථානයේ (CETRAC) රු.568,847 ක ණයගැති ශේෂය අදාළ පුහුණු වැඩසටහන්වලට සහභාගීවන්නන්ට ණය

පහසුකම් පුළුල් කිරීම හේතුවෙන් ඇති වී තිබුණු අතර එම හිඟ ණයගැති ශේෂය අයකර ගැනීම සැක සහිත වී තිබුණි.

(ඇ) ඉදිකිරීම් පුහුණු සම්බන්ධයෙන් පාඨමාලා කිහිපයක් ආයතනය විසින් පුහුණුව සඳහා පිහිටුවන ලද මධ්‍යස්ථානයක් වන ජනාවාස සැලසුම් හා සංවර්ධනය සඳහා මධ්‍යස්ථානය (CHPD) විසින් පවත්වා තිබුණි. 2013 දෙසැම්බර් 31 දිනට හිඟ පාඨමාලා ගාස්තු රු.175,000 ක් 2014 දෙසැම්බර් 31 වන විටත් අයකර ගැනීමෙන් තොරව පැවතුණි.

(ඈ) 1997 සිට 2004 කාල පරිච්ඡේදය තුළදී මෝටර් වාහන හා පිරියත සහ යන්ත්‍රෝපකරණ කුලියට දීමට අදාළව ජාතික උපකරණ හා යන්ත්‍රෝපකරණ ආයතනයෙන් (NEMO) ලැබිය යුතු රු.114,529,393 ක මුදලක් 2014 දෙසැම්බර් 31 වන විටත් අයකර ගැනීමෙන් තොරව පැවතුණි. කෙසේ වුවද එම හිඟ ශේෂයන් සඳහා මූල්‍ය ප්‍රකාශනවල සම්පූර්ණ ප්‍රතිපාදනයක් සිදුකර තිබුණි.

### 2.2.4 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වූ අනුකූල නොවීම් අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| 1971 අංක 38 දරන මුදල් පනත | |
| (අ) 11 වගන්තිය | මුදල් අමාත්‍යාංශයෙන් අවශ්‍ය අනුමැතිය ලබාගැනීමෙන් තොරව සමාලෝචිත වර්ෂය තුළ රු.15,707,803 ක මුදලක් භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කර තිබුණි. |
| (ආ) 13 (2) වගන්තිය | 1998 සිට 2011 කාලපරිච්ඡේදය සඳහා රු.1,417,983 ක් වූ විගණන ගාස්තු ඉදිකිරීම් අභ්‍යාස හා සංවර්ධන ආයතනය විසින් 2014 වර්ෂය අවසානය දක්වාත් ගෙවා නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා ආයතනයේ මෙහෙයුම්වලින් වූ ප්‍රතිඵලය රු. 20,384,756 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.19,724,647 ක් වූයෙන් රු.660,109 කින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලවල පිරිහීමක් දැක්වුණි. ආදායම හා භාණ්ඩාගාර ප්‍රදාන පිළිවෙලින් රු.26,364,017 කින් හා රු.21,609,999 කින් වැඩිවීමට ප්‍රතිරූපීව රු.47,377,348 කින් වියදම වැඩිවීම මූල්‍ය ප්‍රතිඵලයෙහි මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 266 ක් වූ කාර්ය මණ්ඩලය, රු. මිලියන 1,227 ක් වටිනා මුළු වත්කම් යොදා ගැනීම හා සමාලෝචිත වර්ෂය තුළ ලැබුණු රු. මිලියන 91 ක රජයේ දායකය හේතුවෙන් ආයතනයේ මෙහෙයුම් ඌනතාවය රු. මිලියන 20 ක් විය.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා ආයතනයේ ඌනතාවය මුළු වත්කම්වලින් සියයට 1.6 ක් නියෝජනය වූ අතර එය ඉකුත් වර්ෂයේ සියයට 3 ට සාපේක්ෂව සියයට 1.4 ක හිතකර තත්ත්වයක් විය.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1996 වර්ෂයේ සිට විදේශ ආධාර ගිණුමේ පැවත එන රු.2,663,659 ක ශේෂය මහා භාණ්ඩාගාරයට ආපසු ගෙවීමට ඵලදායී ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ආ) තථ්‍ය අවශ්‍යතාවය පිළිබඳ තක්සේරු කිරීමකින් තොරව රු.4,351,000 ක මුළු පිරිවැයකට කොන්ත්‍රාත්කරුවන්ගේ නාමාවලීන් පිටපත් 2000 ක් 2009 වර්ෂයේදී මුද්‍රණය කර තිබුණි. එහි අඩංගු තොරතුරු මේ වන විටත් යල් පැන ගොස් තිබුණද, පිටපත් 966 ක් 2014 දෙසැම්බර් 31 වන විටත් ගබඩාවේ නිෂ්කාර්යව පැවතුණි.

(ඇ) ඉදිකිරීම් උපකරණ පුහුණු මධ්‍යස්ථානයේ (CETRAC) 2014 වර්ෂය සඳහා මෙහෙයුම් පාඩුව රු.26,435,396 ක් වූ අතර, ශුද්ධ ලාභ අනුපාතය සෘණ සියයට 101 ක් විය. කෙසේ වුවද මෙම අසාර්ථක වීම සඳහා හේතුව ජ්‍යෙෂ්ඨ කළමනාකරණ රැස්වීම්වලදී සාකච්ඡා කර නොතිබුණි.

(ඈ) ආදර්ශ ඉදිකිරීම් ක්‍රම හඳුන්වා දීම හා ප්‍රදර්ශනය කිරීම නවීන හා සාම්ප්‍රදායික ගොඩනැගිලි ද්‍රව්‍ය සහ ශිල්පීය ක්‍රම වර්තමානයේ යොදා ගැනීම, ඉදිකිරීම් පිළිබඳ දැනුම සමාජයට දැක්වීම හා බෙදා ගැනීම ජාතික පරිසර ඉදිකිරීම් තාක්ෂණ තේමා උද්‍යානය (National Environment Construction Technical Theme Park) විසින් ක්‍රමයෙන් ඇතිකර තිබුණි. ඉහත ව්‍යාපෘතිය 2011 දෙසැම්බර් මාසයේදී ආරම්භ කර තිබූ අතර වර්ෂ තුනකින් නිම කිරීමට සැලසුම් කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ඉදිකිරීම් කර්මාන්තයේ විශේෂ උනන්දුවක් දක්වන්නන් විසින් පරිපාලන ගොඩනැගිල්ල ඉදිකිරීම හැර ව්‍යාපෘතියේ අනෙකුත් සියලු සංරචක භාරගත යුතුය. ව්‍යාපෘතියේ පරිපාලන ගොඩනැගිල්ල සඳහා රු. මිලියන 60 ක් මූල්‍යායනය කිරීම සඳහා රජය එකඟ වී තිබුණු අතර ඉන් රු. මිලියන 40 ක් 2014 දෙසැම්බර් 31 වන විට ඉදිකිරීම් අභ්‍යාස හා සංවර්ධන ආයතනයට මුදාහැර තිබුණි. මෙම කාර්යය සඳහා වෙන් කරන ලද කාලය දැනටමත් ඉකුත් වී තිබුණද ඉදිකිරීම් වැඩ තවමත් කෙරීගෙන යමින් පැවතුණි.

(ii) ව්‍යාපෘති කාල පරිච්ඡේදය තුළ ආදර්ශ නිවාස 5 ක් ඉදිකිරීම සඳහා ව්‍යාපෘතිය සැලසුම් කර තිබුණි. කෙසේ වුවද ආදර්ශ නිවාස 4 ක් පමණක් ඉදිකිරීම ආරම්භ කර තිබූ අතර ඉන් දෙකක් පමණක් වර්ෂ තුනක නිශ්චිත කාල පරිච්ඡේදය තුළදී නිම කර තිබුණි.ඉතිරි ආදර්ශ නිවාස 2015 මැයි 31 වන විටත් ඉදිකර නොතිබුණි.

(iii) ව්‍යාපෘති යෝජනාවේ ඇතුළත් වැසි ජල අස්වනු පද්ධති සහිත නිවාස ඉදිකිරීම්, බලශක්ති කාර්යක්ෂමතාවයන් ලෙස සූර්ය බලශක්තිය ඵලදායීව යොදා ගැනීම ප්‍රදර්ශනය කිරීම, නවීන සුළං බල උත්පාදන පිරියත ස්ථාපිත කිරීම, වියළි කලාපීය

ප්‍රදේශ සඳහා මැටි පාරවල් ඉදිකිරීම ආදී කාර්යයන් 2015 මැයි අවසානය වන විටත් නිම කර නොතිබුණි.

(iv) තේමා උද්‍යානයේ නීතිමය අයිතිය නිරවුල්ව හඳුනාගෙන නොතිබුණි.

(ඉ) 2014 වර්ෂයේදී ඉදිකිරීම් අභ්‍යාස හා සංවර්ධන ආයතනය විසින් “මහාභිමාණී” ජාතික ඉදිකිරීම් සම්මාන උත්සවය දෙවන වරටත් පවත්වන ලදී. කර්මාන්තයේ පුද්ගලයන් දිරිමත් කිරීම, සමාජ ආකල්ප වෙනස් කිරීම හා ඉදිකිරීම් කර්මාන්තය සඳහා ආකර්ශණීය පරිසරයක් ඇති කිරීම ආදී අරමුණු ඉටු කර ගැනීම සඳහා රු.11,322,890 ක වියදමක් දරා තිබුණි. කෙසේ වුවද එම මුළු වියදමෙන් රු.5,961,712 ක් හෙවත් සියයට 53 ක්, අවශ්‍ය ප්‍රමාණයට වඩා ප්‍රචාරය සඳහා දරා තිබුණි.

## 4.2 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රේඛීය අමාත්‍යාංශයේ ඉල්ලීමට අනුව, “දැයට කිරුළ” වැඩසටහන සහ ලෝක ජනාවාස දින වැඩසටහන ප්‍රචාරණය සඳහා රු.1,156,250 ක මුදලක් ආයතනය විසින් දරා තිබුණි.

(ආ) 2014 වර්ෂයේදී “මහාභිමාණී” වැඩ සටහනේ ප්‍රචාරක වියදම් සඳහා නිකුත් කරන ලද රු.4,671,161 ක් වටිනා චෙක්පත් 5 ක් පසුව 2015 ජනවාරි මාසයේදී අවලංගු කර තිබූ අතර මෙම චෙක්පත් අවලංගු කිරීම සඳහා හේතුව විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2014 වර්ෂය සඳහා ඉදිකිරීම් අභ්‍යාස හා සංවර්ධන ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලය රු.20,384,756 ක ඌනතාවයක් විය. කෙසේ වුවද ආයතනයේ කාර්ය මණ්ඩලය සඳහා වාර්ෂික ප්‍රසාද දීමනා ගෙවීමේ අරමුණ සඳහා රු.31,529,349 ක ශුද්ධ ලාභයක් එම වර්ෂය සඳහා දක්වමින් වෙනම ආදායම් ප්‍රකාශනයක් ආයතනය විසින් පිළියෙල කර තිබුණි. ඒ අනුව 2014 නොවැම්බර් 21 දිනැති අංක 05/2014 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයට පටහැනිව එහි කාර්ය මණ්ඩලයට ප්‍රසාද දීමනා ලෙස රු.3,380,459 ක මුදලක් ගෙවා තිබුණි.

## 4.3 මානව සම්පත් කළමනාකරණය

2014 දෙසැම්බර් 31 දිනට ආයතනයේ අනුමත හා තථ්‍ය කාර්ය මණ්ඩලය පිළිවෙලින් 360 ක් හා 266 ක් විය. පුරප්පාඩු 94 කින් අභ්‍යන්තර විගණක, මුදල් අධ්‍යක්ෂ, නියෝජ්‍ය මෙහෙයුම් අධ්‍යක්ෂ (පුහුණු මධ්‍යස්ථානය) ආදී විධායක මට්ටමේ තනතුරු 16 ක් ඇතුළත්ව පුරප්පාඩු 25 ක් වර්ෂ කිහිපයක සිට එම තනතුරු පුරප්පාඩු පිරවීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ගයක් ගැනීමෙන් තොරව 2014 දෙසැම්බර් 31 දිනට වැඩ බැලීමේ පදනම මත පැවති බව විගණනයේදී නිරීක්ෂණය විය.

## 5. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

## 5.1 වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම

ඉදිකිරීම් උපකරණ පුහුණු මධ්‍යස්ථානයේ (CETRAC) වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම අනුව, උපදේශක අංශයේ ප්‍රධාන කාර්යයන් වූයේ ඉදිකිරීම් කර්මාන්තය සඳහා උපදේශක සේවා, උපදේශන සේවා හා නඩත්තු කළමනාකරණ සේවා සැපයීමයි. කෙසේ වුවද ඉදිකිරීම් උපකරණ පුහුණු මධ්‍යස්ථානය විසින් 2014 වර්ෂය තුළදී මෙම සේවාවලින් උපයන ලද ආදායම රු.354,870 ක් පමණක් විය.

**5.2 අයවැය පාලනය**

සමාලෝචිත වර්ෂය සඳහා ආයතනයේ අයවැය සහ තථ්‍ය ආදායම හා වියදම අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

**6. පද්ධති හා පාලන**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ඉදිකිරීම් අභ්‍යාස හා සංවර්ධන ආයතනයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ගිණුම්කරණය
(ආ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්
(ඇ) ගිණුම් වාර්තා පවත්වා ගැනීම
(ඈ) ඉන්වොයිසි නිකුත් කිරීම
(ඉ) ස්ථාවර වත්කම් පාලනය
(ඊ) මානව සම්පත් කළමනාකරණය